පුවතක ඇතුළත් තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කළ යුතු මූලාශ්‍ර අනාවරණය කිරීමේ අවසරය එම මූලාශ්‍රයන්ගෙන් නොලැබෙන්නේ නම් ඒ හෙළිදරවු නොකිරීමේ සදාචාරත්මක වගකීමක් මාධ්‍යවේදීන් අත තිබේ. එවැනි මොහොතකදී වුවත්, තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ. නමුත් පුවත් වාර්තාවක වන කරුණු ලබාගත් මූලාශ්‍රයන් සඳහන් නොකිරීම සාමාන්‍ය භාවිතය විය යුතු නොවේ. මන්දයත්, ඇතැම් විටක මූලාශ්‍ර සඳහන් නොකරමින් සාවද්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු පවා ඉදිරිපත් කිරීමේ හැකියාවක් තිබෙනා බැවිනි.

ඒ අනුව බලන කළ, දිවයින (03/19) පුවත්පතේ මෙම පුවත් වාර්තාවන්හි අඩංගු කරුණු සම්බන්ධයෙන් කිසිදු විශ්වසනීය මූලාශ්‍රයක් නොමැති වීම පාඨක අප වටහා ගත යුත්තේ කෙසේද? එම තොරතුරු සම්බන්ධයෙන් අදාළ මාධ්‍යවේදියා සහ මාධ්‍යය වගවන්නේද? සඳහන් නොකළද එම තොරතුරු සඳහා නිසි මූලාශ්‍ර පදනමක් තිබේද? එවැනි මූලාශ්‍ර පදනමක් නොමැත්තේ නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද?

මූලාශ්‍ර:
https://ethics.journalists.org/topics/confidential-sources/?fbclid=IwAR3rhFkZfmM3TkyPjk4QrHgigB55KOopWZ2E8DdanB4vZ_RL-rUlMszGcls
https://www.ap.org/about/news-values-and-principles/telling-the-story/anonymous-sources?fbclid=IwAR1qcFVyA3VdQbrFUdtt9n0U6nNjHRVZEMlMpc5Mkk2dT8varbytKSt8pmY

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina